**3. ගාථාව**

**දුන්නිග්ගහස්ස ලහුනෝ - යත්ථ කාමනිපාතිනෝ,**

**චිත්තස්ස දමථෝ සාධු - චිත්තං දන්තං සුඛාවහං.**

## පදගතාර්ථය

**දුන්නිග්ගහස්ස** - නිග්‍රහ කොට හික්මවාලිය නො හැකි,

**ලහුනෝ** - වහා ඉපිද නැසෙනසුලු වූ,

**චිත්තස්ස** - චිත්තයාගේ,

**දමථෝ** - දමනය කිරීම,

**සාධු** - මැනවි,

**චිත්තං** - සිත,

**දන්තං** - දමනය කරන ලද්දේ,

**සුඛාවහං** - (ලොවුතුරු) සැප ගෙන දෙන්නේ ය.

## භාවාර්ථය

වහා ඉපිද වහා නැසෙන්නා වූ ද, යුතු අයුතුකම් නො සලකා ඒ ඒ තැන වැටෙන්නා වූ ද, සිත දමනය කිරීම මැනවි. දමුනු සිත සුව එළවයි.

## නිදාන කථාව

කොසොල් රජුට අයත් දනව්වක කන්දක් පාමුල ඇලගමු නම් ගමක් විය. එහි බොහෝ මනුෂ්‍යයෝ වූහ. එහි 'මාතික' නම් ගම් පෙදෙසක් විය. ඒ ගම අධිපතියා ද එනමින් ප්‍රසිද්ධ විය. ඔහුගේ මව් මාතිකමාතා නමින් ප්‍රසිද්ධ ය. ඕ තොමෝ නිතර භික්ෂූන් වහන්සේ සිය ගෙට වැඩම කරවා දන් දෙන්නී ය.

එකල බුදුරජාණන් වහන්සේ වෙතින් කමටහන් උගත් භික්ෂූන් වහන්සේලා සැටනමක් ඒ ගමට වැඩ මාතිකමාතාවගේ ආරාධනයෙන් එහි 'වස්' විසූහ. දිනක් පන්සලට ගියමාතික මාතාවට එක භික්ෂුවක් හෝ දැකිය නො හැකි විය. භික්ෂූන් වහන්සේලා ඔවුනොවුන් කතිකා කර ගෙන වෙන වෙන කුටිවල භාවනා කරමින් වැඩවිසූහ. ඒ බව එහි සිටි කැපකරුගෙන් දැන ගෙන භික්ෂූන් වහන්සේලා වැඩම කරවා ගැනීම පිණිස 'ගෙඩිය' නාද කෙරෙව්වා ය. 'ගෙඩි-හඬ' ඇසූ භික්ෂූන් වහන්සේලා එක එක තැනින් අවුත් උපස්ථාන ශාලාවෙහි රැස් වූහ.

උපාසිකා තොමෝ තනි තනි ව වැඩි භික්ෂූන් දැක "අසමගියක් ද" යි අසා, "නැත, අපි තනි තනි ව සිට මහණදම් පුරන්නෙමු"යි කියා භික්ෂූන් වහන්සේලා පැවසූ කල්හි උපාසිකා තොමෝ

"මහණදම් නම් කිමෙක් ද"යි අසා දැන, භාවනා ක්‍රම අසා දැන ගෙන ඕ තොමෝ ද ද්වත්තිංසාකාරය වඩා ඒ භික්ෂූන්ට පෙරාතු ව අනාගාමී ඵලය දක්වා මාර්ග-ඵල සුව ලැබුවා ය. පසු ව ඇය එම භික්ෂූන් වහන්සේලා මාර්ග-ඵල සුවයෙන් තොර අය ඇති බව දැන සිවුපසයෙන් මනා ව උපස්ථාන කොට රහත් ඵලය ලැබීම දක්වා එම භික්ෂූන්ට උපස්ථාන කළා ය.

පසු ව එම භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ තමනට වැඩ සැලසූ උවැසියගේ ගුණ කථනය කළහ. එහි සිටි එක්තරා භික්ෂුවක් ඈ පිළිබඳ ගුණකථාව අසා එහි යනු කැමති ව බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් ගෙන එහි ගොස් උවැසියගෙන් සෑම උපස්ථානයක් ම ලැබුවේ ය. උපාසිකාව ද එම භික්ෂුව සිතූ සිතූ දෙය ලැබෙන්නට සැලසුවා ය. උවැසිය පරසිත් දන්නා කෙනෙකි. එහෙයින් ඒ භික්ෂුව එහි සිටීමට බිය වී පසු ව නැවත බුදුරජාණන් වහන්සේ වෙත ගියේ ය. බුදුරජාණන් වහන්සේ තොරතුරු විචාරා නැවත එහි යන්නැ'යි වදාළ සේක. එම භික්ෂුව පසු ව එහි ගොස් සිත දමනය කොට රහත් බවට පත් විය. මෙම උපාසිකාව තමාට කළ උපකාරයට හේතු වූ අතීත ආත්මභාව සලකනුයේ එක ආත්මභාවයක දී තමා වෙනුවෙන් දිවි දුන් බව ද දැක තුටු ව ඇයට නිර්වාණාවබෝධයට කරුණු දක්වා නිවන් අවබෝධ කරවා පිරිනිවන් පෑ සේක.

සාධු ! සාධු !! සාධු !!!

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය,
උග්ගල්බොඩ, ගම්පහ.
**Tel: 077-3811301 / 071-4417813**
**Email: info@sadaham.net**
(ඇසළ 2553)

**<u>සම්පාදක:</u>** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ ප්‍රධාන අනුශාසක අතිගරු පූජනීය මීතලාවේ විනීත ස්වාමීන් වහන්සේ

**<u>පරිගණක සැකසුම:</u>** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා

**<u>ධර්මදානය:</u>** පින්වත් සනත් කොඩිතුවක්කු උපාසක මහතා, සත්මි දියණිය සහ රසිකා මාලගේ මහත්මිය විසින් මාතර, හිත්තැටිය (නැගෙනහිර) පදිංචි ව සිට අභාවප්‍රාප්ත වූ දයාපාල කොඩිතුවක්කු පියාණන්ට සහ ධර්මාවතී ලියනගේ මෑණියන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස සහ තමන්ට ධර්මාවබෝධය පිණිස මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්දයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්-ලිපි* **www.sadaham.net** *යන 'වෙබ්' අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2009**